# ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
## தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார விவகாரங்கள் அமைச்சு
## MINISTRY OF NATIONAL POLICIES AND ECONOMIC AFFAIRS

"මිලෝදා" (පැරණි ටයිම්ස් ගොඩනැගිල්ල), පළමු මහළ, බ්‍රිස්ටල් වීදිය, කොළඹ 01. / 'மிலோதா', 1ஆம் மாடி,பிரிஸ்டல் வீதி,கொழும்பு 01./ "Miloda"(Old Times Building), 1st Floor, Bristol Street, Colombo 01


මගේ අංකය / எனது இல / My No: MNPEA/PLN/RIDP/2016

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 25.04.2016

චක්‍රලේඛ අංක 02/2016 (i)

සියළුම දිස්ත්‍රික් ලේකම්වරු වෙත,

**<u>ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන ( RIDP) 2016</u>**

මාගේ අංක MNPEA 02/2016 හා 2016.03.24 දාතමින් යුතු චක්‍රලේඛය හා බැඳේ.

කරුණාකර උක්ත චක්‍රලේඛයේ අදාල ඡේදයන් සඳහා පහත සඳහන් කරුණු ඇතුළත් කරන්න.

**<u>ඡේද අංක 02</u>**

"ඉහත වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීට අමතරව ආර්ථික සංවර්ධන නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී සහ කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වැනි ග්‍රාමීය මට්ටමේ ක්ෂේත්‍ර නිලධාරින්ගේ සහයෝගය ලබාගැනීමට කටයුතු කරන්න."

**<u>ඡේද අංක 03</u>**

"3.6 – ප්‍රදේශයේ ස්වයං රැකියාලාභීන්ට / ව්‍යවසායකයන්ට ඔවුන්ගේ කර්මාන්ත / වෙළඳ කටයුතු වැඩිදියුණු කරගැනීම සඳහා උපකාර වශයෙන් සමස්ත ප්‍රතිපාදන වලින් 30% දක්වා වෙන් කළ හැක. එක් ව්‍යවසායකයෙකු සඳහා රු : 25,000 කට නොඅඩු හා රු : 50,000 කට නොවැඩි වටිනාකමින් යුත් උපකරණ / ද්‍රව්‍ය සෘජු ප්‍රදාන ලෙස ලබා දිය හැකිය. ව්‍යාපෘති හඳුනාගැනීම සඳහා පිහිටුවන ලද ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමේ කමිටුවේ නිර්දේශය මත ප්‍රතිලාභීන් හඳුනා ගැනීමේ හා එම යෝජනා සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාගැනීමේ වගකීම ප්‍රාදේශීය ලේකම් සතු වේ. තවද, ලබාදෙන ලද උපකරණ / ද්‍රව්‍ය ප්‍රතිලාභීන් විසින් විධිමත්ව උපයෝජනය කරන්නේදැයි අධීක්ෂණය කිරීම සඳහා වැඩ පිළිවෙලක් ප්‍රාදේශීය ලේකම් විසින් සැකසිය යුතුවේ.

ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී පහත දැක්වෙන නිර්ණායක සැලකිල්ලට ගත යුතුය.

- ❈ ප්‍රතිලාභියා යටතේ වැටුප් ලබන රැකියා අවස්ථා නිර්මාණය වන බව
- ❈ අගය එකතුකිරීම
- ❈ ව්‍යවසායකයා විසින් නිපදවන භාණ්ඩ/සේවා සඳහා දේශීය වෙළඳපොළ තුල ඉල්ලුමක් පවතින බව
- ❈ ප්‍රතිලාභියා දැනටමත් අදාළ කර්මාන්තයේ/වෙළඳාමේ නියුක්තව සිටින බව සහ ඔහු/ඇය මේ වනවිට එම කර්මාන්තයට/වෙළඳාමට අවශ්‍ය කුසලතා/දැනුම ලබාගෙන ඇතිබව
- ❈ එකී කර්මාන්තය/ වෙළඳාම තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා ඉඩ ප්‍රස්ථාව පවතින බව"

ජේද අංක 07

"ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති තේරීමේදී ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මට්ටමේදී උද්ගතවන ගැටලු සම්බන්ධව පොදු එකගතාවයකට පැමිණීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත අදාළ ගැටලු යොමු කල යුතුය."

එම්.අයි.එම්.රෆීක්

ලේකම්

පිටපත් :

1. අග්‍රාමාත්‍ය ලේකම්තුමා - දැ.ගැ.පි
2. ලේකම්, මුදල් අමාත්‍යාංශය - දැ.ගැ.පි
3. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැ.ගැ.පි
4. ලේකම්, විශේෂ ව්‍යාපෘති අමාත්‍යාංශය - දැ.ගැ.පි
5. සියලු පළාත් ප්‍රධාන ලේකම්වරු - දැ.ගැ.පි
6. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - දැ.ගැ.පි
7. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව - දැ.ගැ.පි
8. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව - දැ.ගැ.පි
9. අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව - දැ.ගැ.පි
10. ප්‍රධාන මූල්‍ය නිලධාරී, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය - දැ.ගැ.පි
11. සියලු දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂවරු - දැ.ගැ.පි හා අ.ක.ස.